**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ( අදියර III) - 2017**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ( අදියර III) ට අදාල මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘතියේ කාලය

---

මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවනු ලබන අතර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේ අරමුණු වන්නේ පළාත් අතර ඉහළ සංචලතාවයක් ඇතිකිරීම, මාර්ග ආරක්ෂාව වැඩි කිරීම සහ ගමන් කිරීමේ කාලය, වාහන තදබදය, වාහන මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය සහ පරිසර දූෂණය අඩු කිරීම සහතික කිරීම වේ. මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කඩවත සිට දඹුල්ල දක්වා අදියර 4 ක් යටතේ කුරුණෑගල පොතුහැර සිට නුවර ගලගෙදර දක්වා කි. මී. 34.14 ක් වූ සම්බන්ධිත මාර්ගයක් සමඟ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. මධ්‍යම අධිවේගී මාර්ගයේ පොතුහැර සිට ගලගෙදර දක්වා කොටස ඉදිකිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන මධ්‍යම අධිවේගී මාර්ගයේ අදියර III සඳහා වූ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මත විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුලත් වේ.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ කළමනාකරණය විසින් තීරණය කරනු ලබන එවැනි අභ්‍යන්තර පාලනයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 <u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට එම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලනයෙන් බලන කල ව්‍යාපෘතිය කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘතියේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයන්ට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව, සහ

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේ ද යන බව,

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැටළුවලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන තිබුණු බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

### 2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 2.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත්කරගැනීම් මත වන්දි සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 92.3 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) 2014 දී ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සිදු කරන ලද උපදේශක සමාගමක් විසින් විචලන නියෝගයක් යටතේ හිමිකම්පෑ රු.මිලියන 161ක් නීත්‍යානුකූල වලංගුභාවය සැලකිල්ලට නොගෙන කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම් ගතකර තිබුණි. තවද, අතුරු ගෙවීම් සහතික පත්‍ර බලය ලත්

පාර්ශ්වයන් විසින් සහතික කර නොතිබුණ ද රු.මිලියන 152.60 ක් වූ එම ශේෂයන්ගේ එකතුව 2014 සිට අදාල උපදේශකයාට ගෙවි යුතු ලෙස දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

(ඇ) මීට අමතරව, 2017 දෙසැම්බර් 31 දිනට දේශීය උපදේශකයන් විසින් සිදු කළ ශක්‍යතා අධ්‍යයන මත ගෙවිය යුතු රු.මිලියන 31.60 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

**3. <u>මූල්‍ය හා භෞතික කාර්යසාධනය</u>**

**3.1 <u>අරමුදල් උපයෝජනය</u>**

ලැබුණු තොරතුරුවලට අනුව 2017 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට රු.මි. 2,550 ක ප්‍රතිපාදනයක් අදාල අමාත්‍යාංශය සඳහා වූ අය වැය ඇස්තමේන්තුවෙන් දේශීය මූල්‍ය ප්‍රභවයන් මගින් සපයා දී තිබුණි. තවද, 2014 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බලය ලත් විශේෂිත බැංකුවක් මගින් ලබාගත් ණය මුදලකින් රු.මිලියන 400 ක ප්‍රතිපාදනයක් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා සපයා දී තිබුණි. තවද, 2017 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එම බලය ලත් විශේෂිත බැංකුව මගින් ලබාගත් තවත් ණය මුදලකින් රු.මිලියන 913.60 ක් ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ අරමුණු සඳහා වෙන්කර දී තිබුණි. මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත සඳහන් සපයන ලද ප්‍රතිපාදනවලින් රු. මිලියන 3,266 ක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයේදී උපයෝජනය කර තිබුණි.

**3.2 <u>භෞතික ප්‍රගතිය</u>**

මධ්‍යම අධිවේගී මාර්ගය යටතේ වන කාර්යයන්, පොතුහැර සිට ගලගෙදර දක්වා සම්බන්ධිත මාර්ගයක් සමඟ කඩවත සිට දඹුල්ල දක්වා මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා 2007 සිට 2017 දක්වා කාලය වෙනුවෙන් පිළියෙල කළ ජාතික මහා මාර්ග මහ සැලැස්ම යටතේ උතුරු අධිවේගී මාර්ගය ඉදිකිරීමේ යෝජනාව සංශෝධනය කරමින් 2015 ජූලි 16 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ආරම්භකර තිබුණි. ලබාගත් තොරතුරුවලට අනුව උතුරු අධිවේගී මාර්ගය සහ මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනය ඕස්ට්‍රේලියානු උපදේශක සමාගමක් විසින් 2013 වර්ෂයේ සිට සිදුකර තිබුණි. කෙසේවුවද, අදාල ශක්‍යතා අධ්‍යයනයේ අවසන් වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් නොවීය. ලබාගත් තොරතුරුවලට අනුව ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය සංස්ථාවක් සහ දේශීය විශ්ව විද්‍යාල දෙකක් වෙත ශක්‍යතා අධ්‍යයන ඒකාබද්ධ වාර්තාවක් පිළියෙල කිරීම සහ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමට කටයුතු කර තිබුණි. තවදුරටත් ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු සහ උපදේශකයකු තෝරාගැනීමේ කටයුතු සිදු කර තිබුණි. කෙසේවුවද, ඒ පිළිබඳ විධිමත් ගිවිසුමක් 2018 ජූලි 31 දින වන විටත් අත්සන්කර නොතිබුණි.

**3.3 <u>ඉඩම් අත්පත් කරගැනීමේ ගැටලු</u>**

මාර්ගය ඉදිකිරීමේ අරමුණු සඳහා 2017 දෙසැම්බර් 31 දිනට ඉඩම් කැබලි 662 ක් වූ හෙක්ටෙයාර් 63 ක් ව්‍යාපෘතිය විසින් අත්පත් කරගෙන තිබුණි. ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කාල සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර කටයුතු අධීක්ෂණය කිරීමේ අරමුණු සඳහා ව්‍යාපෘතිය විසින් තොරතුරු යාවත්කාලීනව පිළියෙල කර පවත්වාගෙන ගොස් නොතිබුණි.

**3.4 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව දේශීය උපදේශකයින් තිදෙනකු බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඔවුන් වෙත පාරිශ්‍රමික සහ අනෙකුත් දීමනා ලෙස රු. මිලියන 11.8 ක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

**3.5 <u>මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු</u>**

මාර්ග සංවර්ධන අධිකාරිය සහ වෙනත් ව්‍යපෘති කළමනාකරණ ඒකක විසින් පවරන ලද ව්‍යාපෘතිය විසින් ප්‍රයෝජනයට ගන්නා උපකරණ 47 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මීට අමතරව, ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද උපකරණ 600 ක් සැබෑ ආයු කාලය තීරණය කිරීමට කටයුතු නොකර සහ අදාල වත්කම් වල සාධාරණ වටිනාකම හෙළිදරව් නොකර ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. තවදුරටත් , සමාලෝචිත වර්ෂය සඳහා සිදුකරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අනුව අයිතම 29 ක අඩුවක් වාර්තා වී තිබුණු අතර එය පරීක්ෂා කිරීමට ද පියවර ගෙන නොතිබුණි.